# නාම වරනැගීම හා නාම සාධක ප්‍රත්‍යය භාවිතය II

සැකසුම
සුමිත් ධර්මශ්‍රී
ආනන්දෝදය මහ පිරිවෙණ
රඹුක්කන

# ***සාම්ප්‍රදායික ව්‍යාකරණයෙහි භාවිත සංඥා විධි සූත්‍ර***

- ව්‍යාකරණය සංක්ෂිප්ත කර ගැනීම සඳහාත් අවබෝධය සුකරවීම සඳහාත් මෙම සංඥා විධි සූත්‍ර භාවිත කර ඇති බව පැහැදිලි වෙයි.
- ***ආලපනෙ සි ගසඤ්ඤො*** (ආලපන විභක්තියෙහිදී සි විභක්තිය ග යන සංඥාවෙන් හඳුන්වනු ලබයි)
- ***ඉවණ්ණුවණ්ණාජ්ඣලා*** (පුල්ලිංගයෙහි ඉවර්ණාන්ත ශබ්ද හා උවර්ණාන්ත ශබ්ද පිළිවෙළින් ඣ හා ල යන සංඥාවන්ගෙන් හන්වනු ලබයි.)

- ***තෙ ඉත්ථිඛ්‍යා පො*** (ස්ත්‍රි ලිංගයෙහි ඉවර්ණාන්ත ශබ්ද හා උවර්ණාන්ත ශබ්ද ප යන සංඥාවෙන් හැඳින්වේ.)

    - ***ආ ඝො*** ( ස්ත්‍රි ලිංගයෙහි ආකාරාන්ත ශබ්ද ඝ යන සංඥාවෙන් හැඳින්වේ.)

- මෙම සංඥා විධි සූත්‍රයන්හි අර්ථය නොදැන බාලාවතාර ආදී සාම්ප්‍රදායික ව්‍යාකරණයන්හි **ඝපතො යොනං ලොපො, ඝඨලපා රස්සං** වැනි සූත්‍ර තේරුම් ගැනීම ද අපහසුය.

# ස්ත්‍රී ලිංග පද සාධනය

- පාලියෙහි ස්ත්‍රීලිංගපද සාධනයේ දී භාවිතවන ප්‍රත්‍යය 3ක් කච්චායනයෙහි දැක්වෙයි.
  - **_ආ ඊ ඉනී_** වශයෙනි.
- මොග්ගල්ලායනයෙහි ප්‍රත්‍යය 6කි.
- **_ආ ඊ ඉනී ආනී ඌ තී_** වශයෙනි.

# ආ ප්‍රත්‍යය

- ***ඉත්ථියමතො ආප්පච්චයො***
- අකාරාන්ත නාමයන් කෙරෙන් ස්ත්‍රීලිංගයෙහි ආ යන ප්‍රත්‍යය යෙදේ.
- අජ> අජා එළක > එළකා
- කොකිල> කොකිලා ඛත්තිය > ඛත්තියා
- විශේෂණ පද කිතක පද තද්ධිත පදවලින් පසුව ආ ප්‍රත්‍යය යෙදේ.
- මනාප > මනාපා කාළ > කාළා
- දුතිය > දුතියා තතිය > තතියා
- උපාසක > උපාසිකා නායක > නායිකා ආදී වශයෙනි

# ඊ ප්‍රත්‍යය

- ***නදාදිතො වා ඊ***
- නද අනද ආදී අකාරාන්ත නාමයන් කෙරෙන් ස්ත්‍රීලිංගයෙහි ඊ යන ප්‍රත්‍යය යෙදේ.
- කුමාර> කුමාරී වරැණ> වරැණී ආදී වශයෙනි.
- මෙයට අමතරව ණව ණික ණෙය්‍ය න්තු ආදී තද්ධිතාන්ත ශබ්දවලින් පරව ද ඊ ප්‍රත්‍යය යෙදේ.
- මානව > මානවී නාවික > නාවිකී ගුණවන්තු> ගුණවතී
- සංඛ්‍යාවාචී තද්ධිත කෙරෙන් ඊ ප්‍රත්‍යය යෙදේ.
- චතුත්ථ > චතුත්ථී පඤ්චම > පඤ්චමී ආදී වශයෙනි

# ඉනි ප්‍රත්‍යය

- ***පති භික්ඛුරාජීකාරාන්තෙහි ඉනි***
- පති භික්ඛු රාජ හා ඊකාරාන්ත නාමයන් කෙරෙන් ස්ත්‍රිලිංගයෙහි ඉනි යන ප්‍රත්‍යය යෙදේ.
- පති> පතිනි භික්ඛු >භික්ඛුනි
- රාජ> රාජිනි දණ්ඩී >දණ්ඩිනි
- තද්ධිතාන්ත හා කිතක පදයන්ගෙන් පසුව ඉනි ප්‍රත්‍යය යෙදේ.
- මාලී > මාලිනි තපස්සී >තපස්සිනි
- භයදස්සාවී > භයදස්සාවිනි ධම්මචාරී > ධම්මචාරිනි ආදී වශයෙනි.

# නී ප්‍රත්‍යය

- ඉවර්ණාන්ත උවර්ණාන්ත නාම කෙරෙන් නී යන ප්‍රත්‍යය යෙදේ (මොග්ගල්ලායන)
- ගහපති >ගහපතිනි ලාභී >ලාභිනි
- භික්ඛු > භික්ඛුනි ආදී වශයෙනි

- මාතුල ආදී ශබ්දවලින් පසුව ආනී යන ප්‍රත්‍යය යෙදේ (මොග්ගල්ලායන)
- මාතුල >මාතුලානී ගහපති >ගහපතානී
- වරුණ >වරුණානී ආදී වශයෙනි
- උපමාවාචක කරභ වාම ආදී ශබ්දවලින් පසුව ඌරු ශබ්දය යෙදී පසුව ඌ යන ප්‍රත්‍යය යෙදේ (මොග්ගල්ලායන) කරභ +ඌරු + ඌ = කරභොරූ වාම + ඌරු + ඌ = වාමොරූ ආදී වශයෙනි

- යුව ආදී ශබ්දවලින් පසුව   ති යන ප්‍රත්‍යය යෙදේ (මොග්ගල්ලායන)
- යුව > යුවති     භවන්ත > භොති ආදී වශයෙනි.
- ස්ත්‍රීවාචක පද පුරුෂ ලිංග නාමවලට පසුව යෙදීමෙන් ස්ත්‍රීලිංග නාමපද සාදාගෙන ඇත.
- දෙවධීතා  අසුරකඤ්ඤා  නාගමානවිකා  ආදී වශයෙනි.
- හුදු ස්ත්‍රී ලිංග නාමපද ද ඇත.
- ඉත්ථි මාතු භගිනි භරියා ආදියයි